# වාර්ගික හිංසනයට නිදසුන්

## රැල්ෆ් (Ralph) සිවිල් හිමිකම් පනත යටතේ, පහත කටයුතු නීතිවිරෝධී වේ:

ආරක්ෂිත කණ්ඩායමක් තුළ කිසියම් පුද්ගලයකුගේ සැබෑ හෝ උපකල්පිත සාමාජිකත්වය හේතුවෙන් එම පුද්ගලයාගේ ව්‍යවස්ථාපිත අයිතීන්වලට බලහත්කාරයෙන් හෝ බලය භාවිතා කිරීමේ තර්ජනයන් ඔස්සේ බාධා පැමිණවීම.

ඔවුන්ගේ ආගමේ පදනම මත වන්දනා කිරීම සඳහා ඒකරාශී වන පුද්ගලයින්ට හිතාමතා බාධා කිරීම.

හිංසා කරන බවට තර්ජනය කර ආගමික කටයුතු අධෛර්යමත් කිරීමට උත්සාහ කිරීම.

ආරක්ෂිත කණ්ඩායමක් තුළ කිසියම් පුද්ගලයෙකුගේ සැබෑ හෝ උපකල්පිත සාමාජිකත්වය හේතුවෙන් එම පුද්ගලයාගේ දේපළවලට හානි කිරීම.

ආරක්ෂිත කණ්ඩායමක් තුළ  සැබෑ හෝ උපකල්පිත සාමාජිකත්වය මත පදනම්ව පූජනීය ස්ථානයක් හෝ ගොඩනැගිල්ලකට හානි පැමිණවීම.

ආරක්ෂිත කණ්ඩායමක් තුළ කිසියම් පුද්ගලයෙකුගේ සැබෑ හෝ උපකල්පිත සාමාජිකත්වය මත පදනම්ව ඔහුට පහර දීම.

ආරක්ෂිත කණ්ඩායමක් තුළ කිසියම් පුද්ගලයෙකුගේ සැබෑ හෝ උපකල්පිත සාමාජිකත්වය මත පදනම්ව එම පුද්ගලයාට එරෙහි නීත්‍යනුකූල නොවන හිංසනයක් වෙනුවෙන් පෙනී සිටීම සහ එම පෙනී සිටීම තුළින් ආසන්න නීතිවිරෝධී ක්‍රියාවක් ඇති කිරීමට හෝ ඒ සඳහා පෙළඹවීමට හේතුවීම සහ එවැනි ක්‍රියාවක් සිදු කිරීමේ ඉඩක් තිබීම.

සාධාරණ සේවා නියුක්ති හා නිවාස කටයුතු දෙපාර්තමේන්තුවේ මෙහෙවර වනුයේ  සේවා නියුක්තිය, නිවාස සහ පොදු ඉඩ පහසුකම් ආදී කටයුතු තුළ සිදු විය හැකි නීත්‍යනුකූල නොවන වෙනස්කොට සැලකීම්වලින් සහ වාර්ගික හිංසන හා මිනිස් ජාවාරම් කටයුතුවලින් කැලිෆෝනියාවේ ජනතාව ආරක්ෂා කිරීම වේ.

## වැඩි විස්තර සඳහා:

Department of Fair Employment and Housing

ගාස්තු අය නොකෙරෙන: **(800) 884-1684**

TTY: **(800) 700-2320**

අන්තර්ජාලගතව: **www.dfeh.ca.gov**

**ඔබට මෙහිදීද අප හා සම්බන්ධ විය හැකිය**

ලිඛිත පූර්ව පැමිණිල්ලක් අන්තර්ජාලගතව, ලිපියක් මඟින් හෝ ඊමේල් මඟින් ඉදිරිපත් කිරීමෙන් ඔබව වළක්වන ආකාරයේ ආබාධිතභාවයක් ඔබට තිබේ නම්, ඔබේ පූර්ව පැමිණිල්ල දුරකථනය ඔස්සේ ලියා ගැනීමෙන් DFEH හට ඔබට සහාය විය හැකි අතර බිහිරි හෝ අඩු ශ්‍රවණ තත්ත්වයක් හෝ කථන ආබාධ සහිත පුද්ගලයින්ට, CaliforniaRelay Service (711) ඔස්සේ, එසේ නැතහොත් (800) 884-1684 (හඬ) අංකයට ඔබගේ VRS ඔස්සේ අපව ඇමතිය හැක.

වේලාවක් වෙන් කරවා ගැනීමට, 800-884-1684 (හඬ) හෝ 800-700-2320 (TTY) ඔස්සේ සන්නිවේදන මධ්‍යස්ථානය අමතන්න එසේ නැතහොත් atcontact.center@dfeh.ca.gov වෙත ඊමේල් පණිවුඩයක් එවන්න.

සහාය ඉල්ලා සිටින විට ආබාධ සහිත පුද්ගලයන්හට විකල්ප ආකාරයකින් අප වෙත පිවිසීමට සැලකිය යුතු ඉඩපහසුකම් සැලසීමට  DFEH ඇප කැප වී කටයුතු කරයි. අපගේ ලිය කියවිලි වෙත හෝ වෙබ් අඩවි වෙත පිවිසීමට ඔබ වඩා කැමති ආකාරය පිළිබඳව සාකච්ඡා කිරීමට (800) 884-1684 (හඬ හෝ ක්‍රියාකරු 711 ඔස්සේ), TTY (800) 700-2320 තුළින් DFEH හා සම්බන්ධ වන්න නැතහොත් contact.center@dfeh.ca.gov වෙත ඊමේල් කරන්න.

STATE OF CALIFORNIA
DEPARTMENT OF
FAIR EMPLOYMENT & HOUSING

*DFEH-R01B-SNH -  12/2016*

සාධාරණ සේවා නියුක්ති හා නිවාස කටයුතු

# වාර්ගික හිංසනය සහ සිවිල් අයිතිවාසිකම්

## RALPH රැල්ෆ් සිවිල් හිමිකම් පනත

මෙම පනත මඟින් කිසියම් පුද්ගලයෙකුගේ ගර්භණීභාවය, ළදරු උපත, සහ අදාළ වෛද්‍ය තත්ත්වයන්, ලිංගික අනන්‍යතාවය සහ ලිංගික ප්‍රකාශනය, ජාතිය, වර්ණය, ආගම, පෞරාණික ජාතික සම්භවය, ආබාධිතතාව, වෛද්‍ය තත්ත්වය, ජානමය තොරතුරු, වෛවාහකත්වය, ලිංගික නැඹුරුව, පුරවැසිභාවය, මූලික භාෂාව, සංක්‍රමණික තත්ත්වය, දේශපාලන සම්බන්ධතා, හෝ කම්කරු ආරවුලක තත්ත්වය ඇතුළු සැබෑ හෝ උපකල්පිත ලිංගිකත්වය/ස්ත්‍රී පුරුෂභාවය සම්බන්ධයෙන් වන හිංසන ක්‍රියා හෝ හිංසන ක්‍රියා සිදු කරන බවට වන තර්ජනය කිරීම් තහනම් කෙරේ (කැලිෆෝනියා සිවිල් නීති සංග්‍රහය 51.7).

මෙහි දක්වා ඇති ලක්ෂණ හුදෙක් නිදසුන් පමණක් වන අතර වෙනස් ආකාරයෙන් සැලකීමක් සම්බන්ධයෙන් වන අනෙකුත් පදනම්ද මෙම පනත යටතේ තහනම් වේ. සිවිල් නීතිය යටතේ තහනම් කර ඇති ක්‍රියාවක් සාපරාධී ක්‍රියාවක් වීමට ද ඉඩ ඇති අතර ඒවා උල්ලංඝනය කරන්නන් සාපරාධී දණ්ඩනවලට යටත් වීමට ඉඩ තිබේ. රැල්ෆ් සිවිල් හිමිකම්වලින් කිසියම් පුද්ගලයෙකුට භාණ්ඩ හා සේවා සඳහා වන ගිවිසුමකට එළඹීමේ කොන්දේසියක් ලෙස, පනතේ ආරක්ෂණවලට හිලව් වන ආකාරයේ කටයුතු නියම කිරීමද තහනම් කරන අතර ඊට පැමිණිල්ලක් හෝ නඩු කටයුත්තක් ගොනු කිරීමට හෝ නීතිපතිවරයා, DFEH හෝ නඩු පමුණුවන්නෙකු හෝ නීති පැනවීමේ නියෝජිත ආයතනයක් වෙත දැනුම් දීම ද ඇතුළත් වේ.

## DFEH සිදු කරන්නේ කුමක්ද

### සාධාරණ සේවා නියුක්ති හා නිවාස කටයුතු දෙපාර්තමේන්තුව (DFEH) වාර්ගික හිංසන තහනම් කරන කැලිෆෝනියා සිවිල් නීති පහත අයුරින් බලාත්මක කරයි

⇒පැමිණිලි විමර්ශනය;

⇒නීති උල්ලංඝනයන්වලට එරෙහිව නඩු පැවරීම; සහ

⇒ලිඛිත කරුණු සැපයීම,සම්මන්ත්‍රණ සහ සම්මේලනවලට සහභාගී කරවීම තුළින් වාර්ගික හිංසනය, මිනිස් ජාවාරම, හිරිහැර කිරීම් සහ වෙනස් ආකාරයට සැලකීම තහනම් කෙරෙන නීති සම්බන්ධයෙන් කැලිෆෝනියානුවන් දැනුවත් කිරීම.

# කැලිෆෝනියානු නීතිය යටතේ තහනම් කර ඇත්තේ කුමන ආකාරයේ ක්‍රියාවන්ද?

කැලිෆෝනියා නීතිය අනුව වාචික හෝ ලිඛිත තර්ජන, ශාරීරික පහර දීම් හෝ පහර දීමට තැත් කිරීම්, බලි කුරුටු ඇඳීම, සහ පොදු දේපළවලට හානි පැමිණවීම තහනම් වේ. අනෙකුත් කැලිෆෝනියා නීති මඟින් වන්දනාමාන කිරීම සඳහා ඒකරාශී වන පුද්ගලයින්ට බාධා කිරීම; පූජනීය ස්ථානයක දේපළවලට හෝ ආගමික අධ්‍යාපනික ආයතනයක් සතු ගොඩනැගිල්ලකට  හානි පැමිණවීම; තර්ජන හෝ හිංසනවලින් ආගමික කටයුතු අධෛර්යමත් කිරීමට උත්සාහ දැරීම; හෝ වන්දනා ස්ථාන තුළ දී හෝ කවර හෝ
පුද්ගලික දේපළක හිමිකරු හෝ නිවැසියාගේ ජාතිය, වර්ණය, වංශය හෝ වෙනත් ආරක්ෂිත පදනමක් හේතුවෙන් එම දේපළ ඉලක්ක කර ගනු ලැබූයේ නම්එබඳු දේපළක් මත දී, පුද්ගලයකුට ස්වකීය පුද්ගලික ආරක්ෂාව පිළිබඳ බියක් ඇති කරවීම අරමුණු කර ගනිමින් පුපුරන ද්‍රව්‍යයක් හෝ ගිනි තැබීමක් භාවිතා කිරීමඇතුළු ක්‍රියා සඳහා සාපරාධී දඬුවම් ස්ථාපිත කරනු ලැබේ.

## මෙම නීති වින්දිතයන්ට උපකාරී වන්නේ කෙසේ ද?

තම ජාතිය, වර්ණය, ආගම, පෞරාණික සම්භවය, වයස, ආබාධිතභාවය, ස්ත්‍රී පුරුෂභාවය, ලිංගික නැඹුරුව, දේශපාලන සම්බන්ධතා හෝ කම්කරු ආරවුලක තත්ත්වය වැනි ක්‍රියාවන්ගේ වින්දිතයන් වී ඇති තැනැත්තන්හට මෙම නීති මඟින් සිවිල් පිළියම් ලබා දේ. ලබා දෙන සිවිල් පිළියම්වලට පහත දෑ ඇතුළත් වේ:

- **ප්‍රතිබාධන නියෝග**
- **තථ්‍ය හානි**
- **දණ්ඩනීය හානි**
- **සිවිල් දඬුවම්**
- **නීතිඥ ගාස්තු**

මෙම නීති මඟින් සලසා ඇති හිමිකම් ක්‍රියාවේ යෙදවීමට පුද්ගලයෙකුට ක්‍රියාමාර්ග ගණනාවක් ගත හැකිය.

# මා වාර්ගික හිංසනයක වින්දිතයෙකු බවට මා විශ්වාස කරන්නේ නම් මා කළ යුත්තේ කුමක්ද?

1. ඔබට මෙම අත්පොත භාවිතා කළ හැකිය. කිසියම් ගැටලුවක් සම්බන්ධයෙන් නීතිඥවරයෙකු, පොලීසිය, හෝ රජයේ නියෝජිත ආයතනයක් හා සම්බන්ධ වන විට එය පෙන්වන්න.

2. කිසියම් හිංසන ක්‍රියාවක් වෙතොත් ඒ බව පොලීසිය වෙත වාර්තා කරන්න. හිංසන තර්ජනය හෝ ක්‍රියාව සහ මෙම ලක්ෂණ (ජාතිය, ලිංගිකත්වය, වයස ආබාධිතභාවය, ලිංගික නැඹුරුව වැනි) අතර සම්බන්ධතාව පැහැදිලි කරන්න. මෙම සම්බන්ධතාවය ඔබේ හෝ ඔබ ඇසුරු කරන කණ්ඩායමේ හෝ තනි පුද්ගලයන්ගේ ලක්ෂණ මත පදනම් විය හැකි බව මතක තබා ගන්න.

3. ඔබට පැමිණිල්ලක් ගොනු කළ හැකිය. පැමිණිල්ලක් DFEH, උසාවිය, හෝ පළාත් පොලිස් දෙපාර්තමේන්තුව, දිස්ත්‍රික් නීතිඥවරයා, හෝ කැලිෆෝනියාවේ නීතිපති වැනි වෙනත් රජයේ ආයතනයක් වෙත ගොනු කළ හැකිය.

ැමිණිල්ලක් DFEH, උසාවිය, හෝ පොලිස් දෙපාර්තමේන්තුව, දිස්ත්‍රික් නීතිඥවරයා, හෝ කැලිෆෝනියාවේ නීතිපති වැනි වෙනත් රජයේ ආයතනයක් වෙත ගොනු කළ හැකිය.

රැල්ෆ් හෝ බානේ සිවිල් හිමිකම් පනත බලාත්මක කිරීම සඳහා කැලිෆෝනියා සිවිල් නීති සංග්‍රහයේ 52 වගන්තිය යටතේ පුද්ගලික නඩුකරයක් ගොනු කිරීමට පුළුවන.

# කැලිෆෝනියාවේ මා පැමිණිල්ලක් ගොනු කරන්නේ කෙසේද?

අපරාධකරුගේ අනන්‍යතාව දැනගත් දිනයේ සිට වසරක් තුළ පැමිණිල්ලක් DFEH වෙත ගොනු කළ යුතු අතර, හානිය සිදු කර වසර තුනක් ඉක්ම ගියහොත් කිසිදු පැමිණිල්නක් ගොනු කළ නොහැකි වේ. නීතිඥවරයෙකු අවශ්‍ය නොවන අතර දෙපාර්තමේන්තු සේවා වෙනුවෙන් කිසිදු ගාස්තුවක් අය කරනු නොලැබේ. පැමිණිල්ල සම්බන්ධයෙන් නිශ්චිත කරුණු සහ පැමිණිල්ලේ සඳහන් චෝදනා සනාථ කිරීම සඳහා වන ලිපි ලේඛනවල පිටපත් ඉදිරිපත් කිරීමට සූදානමින් සිටිය යුතු අතර

**ගාස්තු අය නොකෙරෙන (800) 884-1684 අංකය අමතා ඔබට DFEH හා සම්බන්ධ වීමට පුළුවන**

## සිවිල් ප්‍රතිකර්ම

ප්‍රතිබාධන නියෝග: උසාවියකින් ප්‍රතිබාධන නියෝගයක් ලබා ගත් පසුව, එම නියෝගය උල්ලංඝනය කරන තැනැත්තන්ට දඩ මුදල් නියම කිරීම හෝ සිර දඬුවම් ලබා දීම සිදු කළ හැකිය.

තථ්‍ය හානි: මෙම හානිවලට වෛද්‍ය ප්‍රතිකර්මවල වියදම්, වැටුප් අහිමි වීම, දේපළ අලුත්වැඩියා කිරීම, හෝ චිත්තවේගවලින් සහ ශෝක වේදනාවලින් වන පීඩා විඳීම් සඳහා ගෙවීම් සිදු කිරීම ඇතුළත් වේ.

දණ්ඩනීය හානි: නීති උල්ලංඝනය කරන්නන්හට දඬුවම් ලබා දීම පිණිස උසාවියකට අතිරේක හානි නියම කළ හැකිය.

සිවිල් දණ්ඩන: උසාවියකට $25,000ක දඩ මුදලක් නියම කළ හැකි අතර, එය පැමිණිල්ල ගොනු කරන පුද්ගලයා වෙත ප්‍රදානය කෙරෙනු ඇත.

නීතිඥ ගාස්තු: නීති කෘත්‍යයක් හේතුවෙන් දැරීමට සිදු වන නීතිඥ ගාස්තු ගෙවීමට උසාවියකට නියෝග කළ හැකිය.